සැ. යු. - 2022.01.13 දිනැති අංක 2262/39 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* අවලංගු කරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

අංක 2268/71 - 2022 පෙබරවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.02.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, අනුර කුමාර මනතුංග වන මා විසින්, එකී වගන්තියේ විධිවිධානවලට අනුකූල වී ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු, මේ නිවේදනය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්යය සඳහා "පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමියක්" ලෙස සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**අනුර කුමාර මනතුංග,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2022 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ නයාරු භූමි ප්‍රදේශය**

උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක එම්යූ/83 සෙම්මලෙයි නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සෙම්මලෙයි ගම පිහිටි අංක 70 දරන සර්වේයර් ජනරාල්ගේ අවසාන භූමිතික පිඹුරට කරන ලද්දා වූ ද සර්වේයර් ජනරාල් වෙනුවෙන් මුලතිව් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කේ.වී.එස්.පී. කැකුලාවල විසින් 2019.11.18 දින අනුමත කරන ලද්දා වූ ද 2019.10.07 දිනැති අතිරේක අංක 20 හා පත්‍ර අංක 71 හි සඳහන් පිළිවෙලින් කැබලි අංක 2071 හා 2073 වශයෙන් පෙන්නුම් කර ඇති පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ නයාරු භූමිය පහත සඳහන් පරිදි වේ.

1. **කැබලි අංක 2071 පහත පරිදි**

| | |
|---|---|
| *උතුරට* මෙම පිඹුරේ | කැබලි අංක 2069 ද, |
| *නැගෙනහිරට* මෙම පිඹුරේ | කැබලි අංක 2069 ද, |
| *දකුණට* මෙම පිඹුරේ | කැබලි අංක 2069, 2070 සහ 2072 ද, |
| *බස්නාහිරට* මෙම පිඹුරේ | කැබලි අංක 2070 සහ 2072 ද. |

යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 29, රූඩ් 1, පර්චස් 8.3 *හෙවත්* හෙක්ටයාර 11.8578ක ඉඩම් ප්‍රමාණය සහ

2. **කැබලි අංක 2073 පහත පරිදි**

| | |
|---|---|
| *උතුරට* මෙම පිඹුරේ | කැබලි අංක 2069 සහ 2070 ද, |
| *නැගෙනහිරට* මෙම පිඹුරේ | කැබලි අංක 2070 සහ 2069 ද, |
| *දකුණට* මෙම පිඹුරේ | කැබලි අංක 2069 ද, |
| *බස්නාහිරට* මෙම පිඹුරේ | කැබලි අංක 2069 ද. |

යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 36, රූඩ් 3, පර්චස් 39.4 *හෙවත්* හෙක්ටයාර 14.9715 ඉඩම් ප්‍රමාණයන් වේ.

EOG 2-0641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.